කොළඹ විශ්වවිද්‍යාලය

ශාස්ත්‍ර පීඨය

ශාස්ත්‍රවේදී තෙවන වසර දෙවන සෙමෙස්තර අවසාන පරීක්ෂණය 2018

**ECN: 3265 (මූල්‍ය වෙළෙඳපොළවල්)**

කාලය පැ දෙකකි (02)

ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න

---

01.

I. ආර්ථිකයක සීමිත මූල්‍ය සම්පත් කාර්යක්ෂම අයුරින් බෙදා හැරීම සඳහා මූල්‍ය වෙළෙඳපොළවල්වල ඇති වැදගත්කම සාකච්ඡා කරන්න. (ලකුණු 13)

II. ශ්‍රී ලංකාවේ බැඳුම්කර වෙළෙඳපොළෙහි මෑත කාලීන වර්ධනයන් සහ ශ්‍රී ලංකා ආර්ථිකයට ඒවායෙහි ඇති බලපෑම විවේචනාත්මකව ඇගයීමට ලක් කරන්න. (ලකුණු 12)

02.

I. අවශ්‍ය අවස්ථාවලදී සුදුසු රූප සටහන් භාවිතා කරමින් පොලී අනුපාතය හා ආයෝජනය අතර සම්බන්ධය විවේචනාත්මකව විමසා බලන්න. (ලකුණු 12)

II. ආයෝජකයෙකුට වාණිජමය ව්‍යාපෘතියක් සඳහා 9% ක වාර්ෂික පොලියක් යටතේ වසර පහකට රුපියල් 500,000 ක් ණයට ගැනීමට අවශ්‍යව ඇත. වසර පහ අවසානයේ දී ණය ආපසු ගෙවනු ලැබේ. වසර පහකට පසුව ආයෝජකයා ගෙවිය යුතු මුදල ගණනය කරන්න.

(ලකුණු 13)

03.

I. පසුගිය සිව් වසර තුළ ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කළ භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ප්‍රධාන ලක්ෂණ කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 15)

II. බැඳුම්කර මිළ හා පොලී අනුපාතය අතර ඇති සම්බන්ධය විවේචනාත්මකව විමසා බලන්න. පිළිතුර පැහැදිලි කිරීමට ඔබේම උදාහරණයක් භාවිතා කරන්න. (ලකුණු 10)

04.

I. නිවසක් මිලදී ගැනීම සඳහා 15% ක වාර්ෂික පොලියක් යටතේ රුපියල් 5,000,000 ක් බැංකුවෙන් ණයට ගැනීමට ආයෝජකයෙකු තීරණය කර ඇත. අපේක්ෂිත උද්ධමන අනුපාතය 7% කි. වසර අවසානයේ සැබෑ උද්ධමන අනුපාතය 12% කි. ණය ගැණුම්කරු සහ ණය ණය සැපයුම්කරුගේ වර්තමාන තත්ත්වය විවේචනාත්මකව විමසන්න. (ලකුණු 10)

II. "විදේශ මූල්‍ය ආයෝජන හරහා ඉහළ පොලී අනුපාත හේතුවෙන් විදේශ විනිමය අනුපාතය අතිප්‍රමානය වනු ඇත". ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟ වන්නේ ද? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 07)

III. "කොටස් වෙළෙඳපොළේ ක්‍රියාකාරිත්වය රටෙහි දේශපාලන ස්ථාවරත්වයට බෙහෙවින් සංවේදී වේ". ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟ වන්නේ ද? ශ්‍රී ලංකාවෙන් උදාහරණ ලබා ගනිමින් ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 08)

05.

I. ඔබ ගව වෙළෙඳපොළ (Bull Market) සහ වලස් වෙළෙඳපොළ (Bear Market) සංකල්ප පැහැදිලි කරන්නේ කෙසේද? (ලකුණු 08)

II. ඔබ විසින් වසරක පරිණතභාවයක් ඇති රු. 850 ක වට්ටම් බැඳුම්කරයක් මිලට ගත් බව උපකල්පනය කරන්න. බැඳුම්කරයේ මුහුණත වටිනාකම රු. 1,000 කි. බැඳුම්කරයේ ප්‍රතිලාභ අනුපාතය ගණනය කරන්න. (ලකුණු 08)

III. පොලී අනුපාතය 13% ක් වන, රු. 100,000 ක වටිනාකමකින් යුත් වසර පහක වට්ටම් බැඳුම්කරයක් මගින් ආයෝජකයෙකුට උපයා ගත හැකි මුදල ගණනය කරන්න. (ලකුණු 09)

06.

I. වර්තමාන ශ්‍රී ලංකා ආර්ථිකය තුළ පවතින බැඳුම්කර අර්බුදයේ ආර්ථික බලපෑම සාකච්ඡා කරන්න. (ලකුණු 12)

II. "විදේශ විනිමය වෙළෙඳපොළේ අධික උච්චාවචනය මූල්‍ය පද්ධතියේ ස්ථායිතාවයට හා ආර්ථිකයේ කාර්ය සාධනයට සෘණාත්මක බලපෑමක් ඇති කරයි". ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟ වන්නේ ද? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 13)

07. පහත ඒවායෙන් පහක් (05) පිළිබඳ කෙටි සටහන් ලියන්න.

I. මුදල් වෙළඳපොළවල කාර්යයන් හා ආර්ථිකයට මුදල් වෙළඳපොළවල වැදගත්කම.

II. මූර්ත පොලී අනුපාතය.

III. බැඳුම්කර සඳහා පවතින ප්‍රාථමික වෙළෙඳපොළ.

IV. කල්පිරීමේ ඵලදාව (Yield to maturity).

V. කොටස් වෙළෙඳපොළ කාර්යයන් හා ආර්ථිකයට කොටස් වෙළෙඳපොළේ වැදගත්කම.

VI. වත්කම් ඉල්ලුම තීරණය කරන සාධක.

VII. වර්තමාන වටිනාකම.

VIII. ඵලදා වක්‍රය (Yield curve).

IX. මූල්‍ය අර්බුද ඇති වීමට හේතු. (ලකුණු 05 බැගින්)